සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 43 S |
|---|---|---|

චිත්‍ර I පත්‍රය | කාලය පැය දෙකයි

නම ..............................................

**සැලකිය යුතුයි :**
- සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01-05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



01. ලංකාවේ ප්‍රථම ස්තූපය වන ........................................................ දාගැබ මෙයින් දැක්වේ.
02. මෙය................................ යුගයට අයත් වේ.
03. මෙම දාගැබ .......................................රජතුමා විසින් ඉදිකරවන ලද්දකි.
04. මෙහි බුදුරජාණන් වහන්සේගේ ...............................................තැම්පත් කර ඇති බව වංශකථාවල සඳහන් වේ.
05. චෛත්‍ය වටා ඇති ගල් කණු මගින් ........................................................ තිබූ බවට සාධක කියාපායි.

ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.

06. "රාමසාන්" උත්සවයේදී ඉටුකරන උපවාස කාලය හඳුන්වනු ලබන අරාබි වචනය
   I. සදකා   ii. සලාත්   iii. සව්ම්   iv. ෂව්වාල්
07. නෙල්ලි ගෙඩියක හැඩයෙන් යුත් ස්ථූප හඳුන්වනු ලබන්නේ
   I. ඝණ්ඨාකාර චෛත්‍ය   ii. ආම්ලාකාර චෛත්‍ය   iii. සටාකාර චෛත්‍ය   iv. ධාන්‍යාකාර චෛත්‍ය
08. ක්‍රිස්තියානි දේවස්ථානයක බිම් සැලැස්ම නිර්මාණයේ හැඩය වන්නේ
   I. ආරුක්කු   ii. වෘත්තාකාර   iii. කුරුසයක   iv. අඩසඳ හා තරුව
09. චෛත්‍ය කොටසක් වන්නේ
   I. දේවතා කොටුව   ii. මිනාර්   iii. අල්තාරය   iv. ගෝපුරම්
10. කාටුන් නිර්මාණවල දැකිය හැකි විශේෂ ලක්ෂණයකි
   I. ළමයාගේ මනස අවුල් කරයි   ii. වැඩිහිටියන් අතර ජනප්‍රියයි
   iii. සරල හැඩතල යොදා ගනී   iv. ළමා මනසට උචිත ආකර්ෂනීය හැඩතල හා වර්ණ රටා භාවිතය

• ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (√) ලකුණද, වැරදි නම් (X) ලකුණද වාක්‍ය ඉදිරියේ ඇති වරහන් තුළ සටහන් කරන්න.

11. දුර ළඟ දක්වීමේ දී මානව, සත්ව හා ශාකවල ප්‍රමාණයන් වෙනස්වේ.(........)
12. නිරීක්ෂණය මගින් පරිසරයේ වස්තුවල හැඩ නිවැරදිව හඳුනා ගත හැකිය.(........)
13. කතාව, දෙබස්, පසුබිම් සංගීතය හා ගීත නිර්මාණ කාටූන්වල සාර්ථකත්වය සඳහා ප්‍රයෝජනවත් නොවේ.(........)
14. කොළඹ ලන්දේසි පල්ලිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ක්‍රිස්තු දේවස්ථානයකි.(........)
15. හින්දු දේවස්ථානවල 'ගර්භ' ගෘහයේ හින්දු දේව ප්‍රතිමා දැකගත නොහැකිය.(........)

• ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැනට යොදන්න.

(මුස්ලිම්, රංජිත, ඇඹීම, පහන්, ද්විතීක)

16. බොරැල්ලේ සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානයේ ......................................................වීදුරු දක්නට ඇත.
17. ...............................................පල්ලියක ඇතුලත ප්‍රතිමා චිත්‍ර දැකිය නොහැක.
18. වෙල් කඳුරු හා නාවා ගෙඩි අතීතයේ ..............................................වෙනුවට යොදාගෙන ඇත.
19. අවශ්‍ය කොටස් එක් කිරීමේ ශිල්ප ක්‍රමය ....................................................යි.
20. මූලික වර්ණ දෙකක් සම සමව යෙදීමෙන් ......................................................වර්ණ සෑදේ.

## II පත්‍රය

ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රයේ පිටුපස සඳහන් කරන්න.
දී ඇති මාතෘකාවලින් එකක් තෝරා චිත්‍රය ඇඳ වර්ණ කරන්න. (ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.)

01. අපේ සුන්දර පාසල් වත්ත
02. සෙනඟ පිරෙන ගමේ කඩේ
03. පන්සලේ ලොකු පිංකමක්
04. මල් කොළ පොහොට්ටු යොදා චීත්ත රෙද්දකට මෝස්තරයක් නිර්මාණය කරන්න.
05. පංති කාමරය අලංකාර කිරීමට සුදුසු විසිතුරු මල් බඳුනකට මෝස්තරයක්.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**• පළමු වාර පරීක්ෂණය - 2019**

**චිත්‍ර 7 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය**

<u>i පත්‍රය</u>

01. ථූපාරාමය
02. අනුරාධපුර
03. දේවානම්පියතිස්ස
04. දකුණු අකු ධාතුව / ශ්‍රීවාස්ථිය
05. වටදාගෙයක්
06. iii.සවිමි
07. ii.ආම්ලාකාර
08. iii.කුරුසයක හැඩය
09. i.දේවතා කොටුව
10. iv.ළමා මනසට උචිත ආකර්ශණීය හැඩතල හා වර්ණ රටා භාවිතය
11. √
12. √
13. x
14. √
15. x
16. රංජිත
17. ක්‍රිස්තියානි
18. පහන්
19. ඇඹීම
20. ද්විතීක

| | | |
|---|---|---|
| I පත්‍රය - එක් පිළිතුරකට ලකුණු 2 බැගින් 20 | - | 40 |
| II පත්‍රය සඳහා | | <u>60</u> |
| මුළු ලකුණු | | <u>100</u> |